කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2022

2025 - ජුලි

**BCOM E 4015 - උපායමාර්ගික කළමනාකරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහයි : (05) කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

චාර්ල්ස් සහ ස්වයින් සමාගම යනු ඇඟලුම් කර්මාන්තයේ ක්‍රියාත්මක වන පිළිගත් සමාගමකි. මෙතෙක් ඔවුන් ක්‍රමානුකූලව උපායමාර්ගික කළමණාකරණ ක්‍රියාවලියක් අනුගමනය කර නොමැති අතර මේ හේතුවෙන් ඔවුන් දැඩි ප්‍රශ්නවලට මුහුණ පා ඇත. ඔවුන්ගේ බොහෝ ගැටළු සංවිධානයේ බාහිර පරිසරය පුරෝකථනය කිරීමට හෝ තේරුම් ගැනීමට ඇති නොහැකියාව හේතුවෙන් ඇතිවී ඇත.

අ. උපායමාර්ගික කළමනාකරණය නිර්වචනය කරමින් උපායමාර්ගික කළමනාකරණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. ඕනෑම සුදුසු මෙවලමක් භාවිතා කරමින්, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ඇඳුම් ව්‍යාපාරයක බාහිර පාරිසරික බලවේග විශ්ලේෂණය කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 02**

අ. දැක්ම, මෙහෙවර සහ අරමුණු යන සංකල්ප අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. "සියලු උපාය මාර්ග සාක්ෂාත් කර ගත් උපාය මාර්ග බවට පත් නොවේ. සමහර ඒවා අතරමගදී පවතින අතර සමහර නව උපාය මාර්ග හදිසියේ මතු වේ." ඔබ එකඟවන්නේ? සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 03**

අ. දී ඇති සමාගමක් සඳහා ශක්තීන් සහ දුර්වලතා පිරික්සුම් ලැයිස්තුවේ සලකා බැලිය යුතු සාධක 4 හඳුනාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. සමාගමක් සිය උපායමාර්ගික කළමනාකරණය සඳහා අගය දාම විශ්ලේෂණය භාවිතා කරන්නේ කෙසේද? තථ්‍ය-ලෝක උදාහරණයක් භාවිතා කරමින් ආකෘතියට අදාලව පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 04**

"IBM ආයතනය, ආරම්භයේදී දෘඩාංග නිෂ්පාදන ව්‍යාපාරයේ යෙදී සිටියේය. කෙසේ වෙතත්, 1990 ගණන්වල මුල් භාගයේදී, මෙය දිගු කාලීනව ඔවුන්ට කිසිදු තරඟකාරී වාසියක් ලබා නොදෙන බව ඔවුන් වටහා ගත් අතර ඒ වෙනුවට මෘදුකාංග සේවාවක් ලෙස (SaaS) හඹා යාමට තීරණය කළහ. මෙය ඔවුන්ගේ ආයතනික උපායමාර්ගයේ ප්‍රධාන වෙනසක් සනිටුහන් කළ අතර ඔවුන්ගේ සමස්ත උපායමාර්ගික දිශානතියටම බලපෑවේය.

අ. ආයතනික මට්ටමේ උපාය මාර්ග සහ දිශානුගත උපාය මාර්ග යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න?

(ලකුණු 08)

ආ. සංකෝචන උපාය මාර්ග හතරක් (04) හඳුනාගෙන එවැනි එක් එක් උපාය මාර්ගය විස්තරාත්මකව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 05**

කෙටි සටහන් ලියන්න.

අ. ක්‍රියාකාරී උපාය මාර්ග

ආ. BCG න්‍යාසය

ඇ. උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

ඈ. සමබර ලකුණු පුවරුව (Balanced Scorecard)

(ලකුණු 5 x 4)

(මුළු ලකුණු 20)